# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1626 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 24/10 /2024<br>පැය 0540 |

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. ගෙවල් බිඳ දේපල සොරකම් කිහිපයක් සිදුකල සැකකරුවෙකු අත්අඩංගුවට - කළුතර අපරාධ කොට්ඨාසය.**

2024.10.23 වන දින සවස් කාලයේ කළුතර දකුණ පොලිස් වසමේ තේක්ක වත්ත ප්‍රදේශයේදී කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත රාත්‍රී කාලයේ ගෙවල් බිඳ දේපල සොරකම් කළ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වාද්දුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන තේක්ක වත්ත, කළුතර දකුණ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී, මොහු වාද්දුව හා කළුතර දකුණ පොලිස් වසම් වල රාත්‍රී කාලයේ ගෙවල් බිඳ දේපල සොරකම් සිදු කිරීමේ අපරාධ කිහිපයක් සිදුකළ පුද්ගලයෙකු බවට අනාවරණය වී ඇත.

සැකකරු විසින් සොරා ගන්නා ලද දේපල වලින් කොටසක් විමර්ශන නිලධාරීන් විසින් සොයා ගෙන ඇත. වාද්දුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පැලියගොඩ පොලිස් ස්ථානය.**

2024.10.23 වන දින සවස් කාලයේ පැලියගොඩ පොලිස් වසමේ කළු පාලම අසලදී පැලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 500 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 57 ක් වන කැලණිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - සෙට්ටිකුලම පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.**

2024.10.23 වන දින රාත්‍රී කාලයේ මැදවච්චිය පොලිස් වසමේ කනදරාව ප්‍රදේශයේදී සෙට්ටිකුලම පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලි ග්‍රෑම් 800 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මැදවච්චිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන මැදවච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මැදවච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.10.23 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ ශ්‍රී ධර්මපාල මාවතේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 900 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05.** **හෙරොයින් සහ මත්පෙති සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - චුන්නාකම් පොලිස් ස්ථානය.**

2024.10.23 වන දින සවස් කාලයේ චුන්නාකම් පොලිස් වසමේ මයිලන්කාඩු ඒලාලේ මාර්ගයේදී චුන්නාකම් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 200 ක් හා මත්පෙති 800 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන ඒලාලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

චුන්නාකම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අනුරාධපුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.10.23 වන දින සවස් කාලයේ අනුරාධපුර පොලිස් වසමේ විජේපුර භාතිය මාවතේදී අනුරාධපුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 150 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අනුරාධපුර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන වන්නියන්කුලම, අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනුරාධපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.10.23 වන දින දහවල් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 11 මිලි ග්‍රෑම් 350 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන කැප්පෙටිපොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. කේරල ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පූනෑව පොලිස් ස්ථානය.**

2024.10.23 වන දින උදෑසන කාලයේ පූනෑව පොලිස් ස්ථානය ඉදිරිපිටදී පූනෑව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ක්ෂණික මාර්ග බාධකයක් යොදා සිදුකල රථවාහන පරීක්ෂාවකදී කේරළ ගංජා කිලෝග්‍රෑම් 04 ග්‍රෑම් 950 ක් සන්තකයේ තබාගෙන බස් රථයකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන රඹෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

පූනෑව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09. නීති විරෝධී මත්පැන් හා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගලේවෙල පොලිස් ස්ථානය.**

2024.10.23 වන දින සවස් කාලයේ ගලේවෙල පොලිස් වසමේ තලකිරියාගම ප්‍රදේශයේදී ගලේවෙල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 94 (බෝතල් 126) ක් හා නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 524 (බැරල් 03) ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන තලකිරියාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගලේවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**10. ව්‍යාජ මුදල් නෝට්ටුවක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොතුවිල් පොලිස් ස්ථානය.**

2024.10.23 වන දින දහවල් කාලයේ පොතුවිල් පොලිස් වසමේ පොතුවිල් ලංකා බැංකු පරිශ්‍රයේදී පොතුවිල් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමට ලද පැමිණිල්ලක් මත මුදල් බැංකු ගත කිරීම සඳහා පැමිණි පුද්ගලයෙකු ව්‍යාජ රුපියල් 5,000/- නෝට්ටුවක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 32 ක් වන පොතුවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොතුවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**11. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කල්ලංචිය පොලිස් ස්ථානය.**

2024.10.23 වන දින දහවල් කාලයේ කල්ලංචිය පොලිස් වසමේ ඔයගම ප්‍රදේශයේදී කල්ලංචිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන රඹෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කල්ලංචිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**12. මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මීගලෑව පොලිස් ස්ථානය.**

2024.10.23 වන දින දහවල් කාලයේ මීගලෑව පොලිස් වසමේ තම්මිටගම ප්‍රදේශයේදී මීගලෑව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 56 ක් වන මීගලෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගලෑව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**13. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොබෙයිගනේ පොලිස් ස්ථානය.**

2024.10.23 වන දින දහවල් කාලයේ කොබෙයිගනේ පොලිස් වසමේ කොබෙයිගනේ ප්‍රදේශයේදී කොබෙයිගනේ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වන කොබෙයිගනේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොබෙයිගනේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**14. සැකකටයුතු මරණයක් - වාරියපොල පොලිස් වසම.**

2024.10.23 වන දින වාරියපොල පොලිස් වසමේ පාදෙණිය ප්‍රදේශයේ මාර්ගයට යාබදව ජලය ගලා බසින ඇළ මාර්ගයක පුද්ගලයෙකු සැකකටයුතු ලෙස මිය ගොස් ඇති බවට වාරියපොල පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 35 ක් වන පොතුවැව, වාරියපොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සිදුකල විමර්ශනයේදී මෘත ශරීරය හමු ස්ථානය ආසන්නයේ විදුලි පහන් කණුවකට යතුරුපැදියක් හේත්තු කර තිබී ඇත. ඒ අසල තිබූ ඇළට මරණකරු වැටී ඇති බවට නිරීක්ෂණය වී ඇති අතර මොහු කුමන ආකාරයකට මෙම ඇළට වැටුණේද යන්න පිළිබඳ මෙතෙක් අනාවරණය වී නොමැත.

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකර පශ්චාත් මරණ පරීක්ෂණ සඳහා කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වාරියපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**15. හදිසි ගින්නක් - තොඩුවාව පොලිස් වසම.**

2024.10.23 වන දින රාත්‍රී කාලයේ තොඩුවාව පොලිස් වසමේ මහවැව නගරයේ පිහිටි මහල් 03 කින් සමන්විත වෙළෙඳසැලක ගින්නක් හට ගෙන ඇති බවට තොඩුවාව පොලිස් ස්ථානයට ලද තොරතුකට අනුව වහාම ක්‍රියාත්මක වූ පොලිස් නිලධාරීන්, හලාවත ගිනි නිවීමේ ඒකකයේ නිලධාරීන් හා ප්‍රදේශවාසීන් එක්ව ගින්න මැඩ පවත්වා ඇත.

ගින්නට හේතුව විදුලි කාන්දුවක් බවට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇති අතර ගින්නෙන් ජීවිත හානි හෝ තුවාල කිසිවක් නොමැත. දේපල හානිය සම්බන්ධයෙන් මෙතෙක් තක්සේරු කර නොමැත. තොඩුවාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**16. මාරක රිය අනතුරක් - නොරොච්චෝලය පොලිස් වසම.**

2024.10.23 වන දින උදෑසන කාලයේ නොරොච්චෝලය පොලිස් වසමේ කල්පිටිය පාලවිය මාර්ගයේ තෙතාපොල මැල්කොලණිය හංදියේදී කල්පිටිය දෙස සිට පාලවිය දෙසට ධාවනය වූ ජීප් රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු හා පසු පැදිකරු බරපතල තුවාල ලබා පුත්තලම රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 44 ක් වූ පොත්තුවිල්ලු, පාලවිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට අදාල ජීප් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර නොරොච්චෝලය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**